# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.20 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 97 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>**

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - දෙහිවල පොලිස් ස්ථානය.**

2025.01.19 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ සිරිපාල මාවත ප්‍රදේශයේදී යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් ගල්කිස්ස පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර තිබුණි.

දෙහිවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දූෂණ මධර්න වැටලීම් හා අපරාධ නිවාරණ රාජකාරි යෙදී සිටියදී, ඉහත මනුෂ්‍ය ඝාතනය සිදුකර පලා යමින් සිටි සැකකරුවන් දෙදෙනාගෙන් **එක් සැකකරුවෙකු ධමර්‍ාරාම මාවතේදී එදින උදෑසන කාලයේදීම පිස්තෝල වගර්යේ ගිනි අවියක්,ජීව පතරොම් 13 ක් සමඟ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 900 ක්** සමග අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන කවුඩාන, දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධය සිදුකිරීමට පැමිණි යතුරුපැදිය හා අනෙක් සැකකරු පැළඳ සිටි ආරක්ෂක හිස් වැසුම ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය ප්‍රදේශයේදී දමා ගොස් තිබියදී, පොලිස් භාරයට ගෙන ඇත.

අපරාධයට සම්බන්ධ අනෙක් සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හදිසි අනතුරකින් කුඩා දරුවෙකු මියයාම - වාද්දූව පොලිස් වසම.**

2025.01.19 වන දින දහවල් කාලයේ වාද්දූව පොලිස් වසමේ දකුණු තල්පිටිය ප්‍රදේශයේදී, කුඩා පිරිමි දරුවෙකු නිවසෙහි ඇති පොකුණට වැටී දියේ ගිලීම හේතුවෙන් මියගොස් ඇති බවට වාද්දූව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගිය දරුවා වයස අවුරුදු 01 ½ ක් වූ වාද්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය දරුවා තම වැඩිමහල් සහෝදරයන් දෙදෙනා සමඟ මිදුලේ සෙල්ලම් කරමින් සිටියදී, නිවස ඉදිරිපිට ඇති කුඩා පොකුණට වැටී දියේ ගිලී මියගොස් ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාද්දූව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පල්ලේකැලේ පොලිස් ස්ථානය.

2025.01.19 වන දින සවස් කාලයේ පල්ලේකැලේ පොලිස් වසමේ දුම්බර බන්ධනාගාරයේදී පල්ලේකැලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 280 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන හන්දෙස්ස ප්‍රදේශයේ පදිංචි බන්ධනාගාර නියාමකවරයෙකි.**

පල්ලේකැලේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.01.19 වන දින දහවල් කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී, මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වු ලුනාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - අරලගංවිල පොලිස් වසම.

2025.01.19 වන දින රාත්‍රී කාලයේ අරලගංවිල පොලිස් වසමේ මැද ඇල්ලේවැව කුඹුරු යායේ 16 ඇල මාගර්යේදී වන අලි පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට අරලගංවිල පොලිසියට ලද පණිවිඩයකට අනුව විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ මැද ඇල්ලේවැව, අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කුඹුරු වන අලින්ගෙන් ආරක්ෂා කරගැනීමට යමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති බවට දැනට සිදුකරනු ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 06. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාම - කළුතර උතුර පොලිස් වසම

2025.01.19 වන දින දහවල් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කැලිඩෝ හංදිය දුම්රිය හරස් මාගර්යේදී මරදාන සිට අලුත්ගම දක්වා ධාවනය වූ දුම්රියක පාපැදිකරුවෙකු ගැටී මියගොස් ඇති බවට කළුතර උතුර පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ මුහුදු වෙරළ පාර, කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හදිසි මරණ පරීක්ෂණ සිදුකිරීමෙන් අනතුරුව මෘත ශරීරය ඥාතීන් වෙත භාරදී ඇත. කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - තෙල්දෙණිය පොලිස් වසම.

2025.01.19 වන දින සවස් කාලයේ තෙල්දෙණිය පොලිස් වසමේ පුද්ගලයෙකු වික්ටෝරියා ජලාශයේ ධීවර රැකියාවට ඔරුවකින් ගොස් සිටියදී ජලාශයට වැටී දියේ ගිලී මියගොස් ඇති බවට තෙල්දෙණිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ අඹකොටේ, කෙන්ගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීර තෙල්දෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. සැකකටයුතු මරණයක් - ඇහැලියගොඩ පොලිස් වසම.

2025.01.19 වන දින ඇහැලියගොඩ පොලිස් වසමේ තොරණගොඩ ප්‍රදේශයේ සම්බාහන මධ්‍යස්ථානයක් තුල නාන කාමරයක පුද්ගලයෙකු සැක කටයුතු ලෙස මියගොස් ඇති බවට ඇහැලියගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ පත්බේරිය, පරකඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. ගජමුතු 07 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් වසම.

2025.01.19 වන දින දහවල් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය නගරයේදී පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **රුපියල් දෙකෝටි විසි ලක්ෂයක මුදලකට විකිණීමට සුදානම් කර තිබූ ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 05 ක් පමන වූ ගජමුතු 07 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 33 වයස්වල පසුවන මාතලේ හා මහවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාන්නේරිය පොලිස් ස්ථානය.

2025.01.19 වන දින දහවල් කාලයේ නාන්නේරිය පොලිස් වසමේ ඉහළ නාන්නේරිය ප්‍රදේශයේදී පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 67 ක් වන මහ නාන්නේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාන්නේරිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 11. පුපුරණ ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් ස්ථානය.

2025.01.19 වන දින සවස් කාලයේදී දඹුල්ල පොලිස් වසමේ දඹුළුගම ප්‍රදේශයේදී දඹුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අඟල් 08 ක් දිග ඩයිනමයිට් අඩංගු ජෙල් කරල් 05 ක්, සෙන්ටිමීටර් 04 ක් දිග ඩෙටනේටර් 10 ක් සහ ඇමෝනියා ග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන දඹුළුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

දඹුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - නාරම්මල පොලිස් වසම.

2025.01.19 වන දින දහවල් කාලයේ නාරම්මල පොලිස් වසමේ නාරම්මල ගිරිඋල්ල මාගර්යේ කිවුල්ගල්ල ප්‍රදේශයේදී, නාරම්මල දෙස සිට ගිරිඋල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දෙසටම ධාවනය වූ බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී පැදිකරුට යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකිව මාගර්ය මත ලිස්සා පෙරලීමෙන් බස් රථයේ පිටුපස රෝදයට පැදිකරුගේ හිස යටවීමෙන් අනතුරක් සිදුව ඇත. යතුරුපැදිය ඉදිරියට ඇදී ගෙන ගොස් ගිරිඋල්ල දෙස සිට නාරම්මල දෙසට ධාවනය වූ කාර් රථයකද ගැටී ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු නාරම්මල  රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ කිරින්ද, පුහුල්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාරම්මල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාරම්මල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - තලාතුඔය පොලිස් වසම.

2025.01.19 වන දින දහවල් කාලයේ තලාතුඔය පොලිස් වසමේ තැන්නේකුඹුර රාගල මාගර්යේ මියිලපිටිය ප්‍රදේශයේදී, තැන්නේකුඹුර දෙස සිට රාගල දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයක් එම දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි බස් රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු, එම ත්‍රිරෝද රථයේ පසුපස ගමන් කළ කාන්තාවක්, තරුණියක් හා පිරිමි පුද්ගලයෙකු බරපතල තුවාල ලබා මාරස්සන

රෝහලට ඇතුලත් කිරීමේදී තරුණිය මියගොස් ඇත. තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා රිකිල්ලගස්කඩ රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 18 ක් වූ උගුරැස්සපිටිය. කටුගස්තොට ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මාරස්සන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, තලාතුඔය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.

2025.01.19 වන දින සවස් කාලයේ පුත්තලම පොලිස් වසමේ පුත්තලම අනුරාධපුර මාගර්යේ සිරම්බිඅඩිය ප්‍රදේශයේදී, නවතා තිබූ යතුරුපැදියක් මාගර්ය හරහා යූ හැඩයට හරවනවාත් සමඟම පුත්තලම දෙස සිට කරුවලගස්වැව දෙසට ධාවනය වූ යතුරුපැදියක ගැටී අනතුරුව එම යතුරුපැදිය පෙරලී පසු පැදිකාරිය මාගර්ය මත වැටී කරුවලගස්වැව දෙස සිට පැමිණි කුඩා ලොරි රථයකට යට වීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසු පැදිකාරිය බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී පසු පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 47 ක් වූ සමගි මාවත, පුත්තලම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කුඩා ලොරි රථයේ රියදුරු හා මාගර්ය හරහා යූ හැඩයට හැරවීමට උත්සහා කළ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. පුත්තලම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 15. රිය අනතුරක් - සේරුනුවර පොලිස් වසම.

2025.01.20 වන දින අළුයම් කාලයේ සේරුනුවර පොලිස් වසමේ සේරුනුවර කන්තලේ මාගර්යේ සේරුනුවර කල්ලාර් යුධ හමුදා කඳවුර ඉදිරිපිට වංගුව අසලදී කාත්තන්කුඩිය දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ මඟී ප්‍රවාහන බස් රථයක් පවතින අධික වෂර්ාව හේතුවෙන් මාගර්යෙන් ඉවතට පැන මාගර්ය අයිනේ තිබූ ගසක ගැටී බස් රථය මාගර්යෙන් ඉවතට පෙරළී අනතුරක් සිදුව ඇත.

**බස් රථයේ මඟීන් 49 ක් පමණ ගමන් කර ඇති අතර අනතුරින් බස් රථයේ රියදුරු සහ රිය සහයක සමඟින් මඟීන් 14 දෙනෙකු ප්‍රතිකාර සඳහා සේරුනුවර රෝහලට ඇතුලත් කර පසුව රියදුරු සහ මඟීන් 09 දෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා ත්‍රිකුණාමලය රෝහල වෙත මාරුකර යවා ඇත.**

අනතුරට හේතුව බස් රථයේ රියදුරුගේ අපරීක්ෂාකාරි රිය ධාවනය බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. සේරුනුවර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**